# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

### කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

## ඩෙස්ක්ටොප් පරිගණක, වර්ණ සහ කළු-සුදු ලේසර් මුද්‍රණ යන්ත්‍ර, කළු-සුදු ඡායා පිටපත් යන්ත්‍ර, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ  තිර සැපයීම

## කොන්ත්‍රාත් අංකය: EDB/PU/NCB/2026/05

01. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට (EDB) ඩෙස්ක්ටොප් පරිගණක, වර්ණ සහ කළු-සුදු ලේසර් මුද්‍රණ යන්ත්‍ර, කළු-සුදු ඡායා පිටපත් යන්ත්‍ර, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ  තිර සැපයීමේ ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා, තැබූ ලංසු  කැඳවනු ලැබේ.

02. 2024 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ දක්වා ඇති ජාතික තරගකාරී ලංසු තැබීමේ (NCB - තනි අදියර තනි කවරය ලංසු තැබීමේ ක්‍රියාපටිපාටිය) ක්‍රමවේදය යටතේ ලංසු තැබීම සිදු කෙරෙන අතර, මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති පරිදි සියලුම සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා මෙය විවෘත වේ.

03. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේ දී කිසිදු රජයේ ආයතනයක් හෝ පිළිගත් නියාමන අධිකාරියක් විසින් අසාදු ලේඛනගත කර, අත්හිටුවා හෝ තහනම් කර නොතිබිය යුතුය.

04. සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා වන සුදුසුකම් නිර්ණායක පහත පරිදි වේ. (අතිරේක සුදුසුකම් අවශ්‍යතා ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇත). උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට 2026 සැප්තැම්බර් 29 දින දක්වා, රජයේ වැඩ කරන දිනවල  09.00 පැය සිට  15.00 පැය දක්වා කාලය තුළ, කොළඹ 02, නවම් මාවතේ, අංක 42 දරන ස්ථානයේ පිහිටි NDB-EDB කුළුණේ 06 වන මහලේ ඇති සහකාර අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන කාර්යාලයේ දී ලංසු ලේඛන පරීක්ෂා කළ හැක. www.srilankabusiness.com/announcements/ යන EDB වෙබ් අඩවියේ “නිවේදන” (Announcements) අංශය යටතේ ප්‍රකාශයට පත් කර ඇති ප්‍රසම්පාදන ලේඛනයට ප්‍රවේශ වීමෙන් ද ලංසු ලේඛන පරීක්ෂා කළ හැක.

**සුදුසුකම් නිර්ණායක**

**අ). සාමාන්‍ය පළපුරුද්ද:**

- ලංසුකරු ශ්‍රී ලංකාවේ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව නීත්‍යානුකූලව ලියාපදිංචි කළ සමාගමක් විය යුතුය.
- ලංසුකරු විසින් ලංසුව ඉදිරිපත් කරන කාණ්ඩයට (Lot) අදාළ උපකරණ සැපයීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් තිබිය යුතුය.

**ආ). විශේෂිත පළපුරුද්ද:**

- ලංසුකරු විසින් ලංසුව ඉදිරිපත් කරන කාණ්ඩයට (Lot) සමාන ස්වභාවයේ උපකරණ සැපයීම සහ නඩත්තු කිරීම සඳහා පසුගිය වසර තුන (03) තුළ අවම වශයෙන් කොන්ත්‍රාත්තු තුනක් (03) සාර්ථකව නිම කර තිබිය යුතුය. අදාළ සේවාදයකයින් විසින් නිකුත් කරන ලද නිර්දේශ ලිපි හෝ සතුටුදායක ලෙස නිම කිරීමේ සහතික මගින් එම කොන්ත්‍රාත්තු නිම කිරීම සනාථ කළ යුතුය.

**මූල්‍යමය හැකියාව:**

**ඇ).** ලංසුකරු විසින් පසුගිය අඛණ්ඩ මූල්‍ය වර්ෂ තුන (03) සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

05. මිලදී ගැනීමට නියමිත උපකරණ සහ ඒවා සඳහා වන ලංසු සුරක්ෂණයන්හි වටිනාකම් පහත පරිදි වේ:

| කාණ්ඩය (Lot) | වර්ගය | ප්‍රමාණය | ආපසු නොගෙවන ගාස්තුව (රු.) | ලංසු සුරක්ෂණය (රු.) |
|---|---|---|---|---|
| කාණ්ඩය 1 | ඩෙස්ක්ටොප් පරිගණක | 20 | 3,500.00 | 60,000.00 |
| කාණ්ඩය 2 | වර්ණ ලේසර් මුද්‍රණ යන්ත්‍ර<br>කළු-සුදු ලේසර් මුද්‍රණ යන්ත්‍ර | 01<br>05 | 1,500.00 | 10,500.00 |
| කාණ්ඩය 3 | කළු-සුදු ඡායා පිටපත් යන්ත්‍ර | 09 | 3,000.00 | 45,000.00 |
| කාණ්ඩය 4 | බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර<br>බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ  තිර | 05<br>04 | 2,000.00 | 36,000.00 |

06. ලංසුකරුවන්ට ඕනෑම තනි කාණ්ඩයක්, කාණ්ඩ කිහිපයක එකතුවක් හෝ සියලුම කාණ්ඩ සඳහා ලංසු ඉදිරිපත් කිරීමට අවසර ඇත. සෑම කාණ්ඩයක්ම වෙන වෙනම ඇගයීමට ලක් කර ප්‍රදානය කරනු ලැබේ. ලංසුකරුවන් විසින් තෝරාගත් කාණ්ඩයක් තුළ දක්වා ඇති අයිතම සහ ප්‍රමාණයන්ගෙන් 100% ක් සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ කාණ්ඩ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට, කොළඹ 02, නවම් මාවත, අංක 42, NDB-EDB කුළුණේ, 06 වන මහල  සහකාර අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන වෙතින් රජයේ වැඩ කරන දිනවල  09.00 පැය සිට  15.00 පැය දක්වා වැඩිදුර තොරතුරු ලබා ගත හැක. දුරකථන: 011-2300702; විද්‍යුත් තැපැල: disna@edb.gov.lk.

08. උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් යුත් සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක්, 5 වන ඡේදය යටතේ දක්වා ඇති පරිදි අදාළ කාණ්ඩය(න්) සඳහා අදාළ වන ආපසු නොගෙවන ගාස්තුව ගෙවීමෙන් පසු, 7 වන ඡේදයේ දක්වා ඇති ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් (EDB) ලබා ගත හැක. ගෙවීම් ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇති ක්‍රමයට අනුකූලව කළ යුතු අතර, අදාළ ගෙවීම් පත්‍රිකාවේ හෝ රිසිට්පතේ පිටපතක් ලංසුව සමග අමුණා තිබිය යුතුය. අදාළ කාණ්ඩය(න්) සඳහා අවශ්‍ය ගෙවීම් සනාථ කිරීම් නොමැතිව ඉදිරිපත් කරන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. ලංසු මුල් පිටපත මුද්‍රා, තැබූ කවරයක බහාලිය යුතුය. කවරයේ ඉහළ වම් කෙළවරේ පහත පරිදි පැහැදිලිව සටහන් කළ යුතුය:

"EDB/PU/NCB/2026/05 - ඩෙස්ක්ටොප් පරිගණක, වර්ණ සහ කළු/සුදු ලේසර් මුද්‍රණ යන්ත්‍ර, කළු/සුදු ඡායා පිටපත් යන්ත්‍ර, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ  තිර සැපයීම (කාණ්ඩ අංක 1 සහ/හෝ 2 සහ/හෝ 3 සහ/හෝ 4)"

ලංසුව ඉදිරිපත් කරන අදාළ කාණ්ඩ අංකය(න්) ලංසුකරු විසින් පැහැදිලිව දැක්විය යුතුය. ලංසුකරුගේ නම සහ ලිපිනය කවරය මත පැහැදිලිව සඳහන් කළ යුතුය. (ලංසු දත්ත පත්‍රිකාවේ, ITB 22.2 (C) බලන්න)

10. ලංසු 2026 සැප්තැම්බර් 30 වන දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර 7 වන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදිනම පෙ.ව. 11:15 ට, 7 වන මහලේ කුඩා සම්මන්ත්‍රණ ශාලාවේදී පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිට ලංසු විවෘත කරනු ලැබේ. සෑම ලංසුවක් සමගම 5 වන ඡේදයේ අදාළ කාණ්ඩය(න්) සඳහා දක්වා ඇති මුදලට සමාන බැංකු ඇපකරයක් ආකාරයෙන් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

11. පූර්ව ලංසු රැස්වීමක් 2026 සැප්තැම්බර් 22 වන දින පෙ.ව. 10.00 ට EDB හි 9 වන මහලේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ දී පැවැත්වේ. උනන්දුවක් දක්වන සියලුම ලංසුකරුවන්ට පූර්ව ලංසු රැස්වීමට සහභාගී විය හැක.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)**
**අංක 42, නවම් මාවත,  කොළඹ 02**
**2026 සැප්තැම්බර් 17**